

***මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගේ සමාලෝචනය.***

1928 දුරුතු මස 01 වන දින පිහිටුවන ලද මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ 83වන කාර්ය සාධන වාර්තාවයි. මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයන් ලෙස මෝටර් වාහන නව ලියාපදිංචි කිරීම, හිමිකම් මාරු කිරීම ලියාපදිංචිය සහ රියදුරු බලපත්‍ර නිකුත් කිරීම දැක්විය හැක. එමෙන්ම මෙහි අතුරු කාර්යයන් වශයෙන් මෝටර් වාහන සම්බන්ධ කාර්මික සේවාව, මාර්ග ආරක්ෂාව පිළිබඳ කටයුතු හා වායු විමෝචන තත්ත්ව නියාමනය කිරීම ආදිය දැක්විය හැක.

වසර 2011 දී මෝටර් රථ නව ලියාපදිංචිය 525,421 ක් වූ අතර එම වසර අවසන් වන විට එහි ප්‍රතිඵලයක් ලෙසින් ශ්‍රී ලංකාවේ මෝටර් රථ ගහනය 4,479,732 විය. මෙම වසරේ දී සිදු කරන ලද වාහන පැවරුම් සංඛ්‍යාව 288,784 ක් වන අතර නිකුත් කරන ලද රියදුරු බලපත් ප්‍රමාණය 305,985 වේ.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ඉටුකරන ලද සමස්ථ සේවාවන් කඩිනමින් හා ඉහළ මහජන ප්‍රසාදයකින් යුක්තව ඉටු කිරීම සඳහා ආයතනයේ මාණ්ඩලික නිලධාරීන් ඇතුළු සියළු කාර්ය මණ්ඩලය කැපවී සේවය කල අතර ඔවුන්ටත් දෙපාර්තමේන්තුවේ සේවා කටයුතු මෙන්ම යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ කටයුතු සඳහා මහ පෙන්වීම් ලබා දුන් ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියළුම අමාත්‍යාංශ කාර්යමණ්ඩලයටත් රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීම තුලින් අප කාර්යක්ෂමව මෙහෙයවූ ගරු ප්‍රවාහන අමාත්‍යතුමාටත් මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි.

**එස්.එච්.හරිස්චන්ද්‍ර**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්

# පටුන


පිටු අංකය

| | | |
|---|---|---|
| අපේ දැක්ම | ......... ………………..……………………………… | x |
| අපේ මෙහෙවර | ……..…………...……………………………… | x |
| අපේ වටිනාකම් | ………………………………………………… | x |
| සංවිධාන සටහන | …………………………………………………. | xii |
| 1. කාර්ය මණ්ඩලය | ..………………….. | 1 |
| 1.1 මාණ්ඩලික නිළධාරී කාර්ය මණ්ඩලය - 2011 | ………………….. | 1 |
| 1.2 අනුමත සේවක සංඛ්‍යාව - 2011 | ………………….. | 2 |
| 1.3 2011 වර්ෂයේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ස්ථාන මාරුවීම ලබා පැමිණි මාණ්ඩලික නිළධාරීන් | ………………….. | 3 |
| 1.4 2011 වර්ෂයේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරුවීම් ලබා ගිය මාණ්ඩලික නිළධාරීන් | ………………….. | 3 |
| 2. කාර්ය මණ්ඩල අභිප්‍රේරණ | ………………….. | 3 |
| 2.1 අභ්‍යන්තර පුහුණු | ………………….. | 3 |
| 2.2 බාහිර පුහුණු | …………………... | 4 |
| 3. පරිපාලනමය කටයුතු | ………………….. | 4 |
| 3.1 කොමසාරිස් ජනරාල් කාර්යාලය | ………………….. | 5 |
| 3.2 ආයතන අංශය | ………………….. | 5 |
| 3.3 සංවර්ධන අංශය | ………………….. | 6 |
| 3.4 ප්‍රධාන කාර්යාලයේ අංශ | ………………….. | 6 |
| 3.5 උප කාර්යාලය | ………………….. | 7 |
| 3.6 දිස්ත්‍රික් කාර්යාලය | ………………….. | 7 |

4. දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන කාර්යයන් ………………….. 8

4.1 වාහන අයිතිය අළුතින් ලියාපදිංචි කිරීම ………………….. 8

4.1.1 වෙළඳ වාහන නව ලියාපදිංචි ශාඛාව ………………….. 12

4.1.2 ත්‍රිවිල් නව ලියාපදිංචි ශාඛාව ………………….. 13

4.1.3 යතුරුපැදි නව ලියාපදිංචි ශාඛාව ………………….. 15

4.2 වාහන හිමිකම් මාරු කිරීම ………………….. 16

4.3 වේරහැර උප කාර්යාලය(රියදුරු බලපත්‍ර නිකුත් කිරීම ) ………………….. 20

4.4 කාර්මික සේවාව ………………….. 22

4.5 වායු විමෝචන පරීක්‍ෂණ කාර්යයන් නියාමනය කිරීම ………………….. 24

5. ආදායම සහ වියදම

5.1 ගිණුම් ශාඛාව ………………….. 25

5.2 සුබෝපබෝගී බදු ශාඛාව ………………….. 26

5.3 අභ්‍යන්තර විගණන හා විමර්ශන ශාඛාව ………………….. 27

5.4 ආදායම් ගිණුම ………………….. 27

5.5 වියදම් ගිණුම ………………….. 28

5.6 ඉදිකිරීම් සම්බන්ධ ප්‍රාග්ධන වැය ව්‍යාපෘති ………………….. 30

ඇමුණුම් 1 වාහන අළුතින් ලියාපදිංචි කිරීමේ ගාස්තු - 2011 ………………….. 31

ඇමුණුම් 2 වාහන පැවරීමේ ගාස්තු - 2011 (එක්දින සේවා) ………………….. 33

ඇමුණුම් 3 වාහන පැවරීමේ ගාස්තු - 2011 (සාමාන්‍ය ගාස්තු) ………………….. 34

ඇමුණුම් 4 නව රියදුරු බලපත්‍රයන්ට අදාළ අධිභාරයන් ………………….. 35

## මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

අංක *341,* ඇල්විටිගල මාවත*,* කොළඹ 05.

දුරකථන අංක*: 2694331-6* ෆැක්ස් අංක *2694338*

විද්‍යුත් තැපැල*: comm..@motortraffic.gov.lk*

වෙබ් අඩවිය www.motortraffic.gov.lk

ආරම්භය - 1928 ජනවාරි 01


### අපේ දැක්ම


*විශිෂ්ට මෝටර් වාහන නියාමනයෙන් ඉහළ මහජන ප්‍රසාදය.*

### අපේ මෙහෙවර

*අභිප්‍රේරණය වූ සේවක සමූහයේ සාමූහික ප්‍රයත්නය හා නවීන තාක්ෂණය යොදා ගනිමින් මෝටර් වාහන පනත හා අනෙකුත් නීති රෙගුලාසි ප්‍රශස්ථ ලෙස ක්‍රියාත්මක කිරීමෙන් ඉහළ මහජන ප්‍රසාදයක් උදෙසා කැපවීම.*

### අපේ වටිනාකම්




DMT
DEPARTMENT OF MOTOR TRAFFIC
ORGANIZATIONAL STRUCTURE
COMMISSIONER GENERAL OF MOTOR TRAFFIC
G.A/D.S
COMMISSIONER (ADMINISTRATION)
COMMISSIONER (DEVELOPMENT)
CHIEF ACCOUNTANT
P.D.(E)
D.C (DL)
D.C (Tr)
D.C (NR)
L.O
Acct (IA)
A.C.AD
A.C (DL)
A.C (DL)
A.C (DL)
A.C (Tr)
A.C (Tr)
A.C (Tr)
A.C (NR)
A.C (NR)
AC (IT)
Acct (P)
Acct (R)
ACC (DL)
Ac (T)
Ac
C.O
A.O.RR
A.O.AD
A.O.
ADPM
A.O.DE
TA
SEMV
A.L.O
S.O(RR1)
S.O(RR2)
S.O(Ad)
S.O
PRGM
T.O
S.K
S.O(T)
EMV
S.O(NP)
EMVV
T.O.(E)
Staff
DESIGNATION ABBR.
G.A/D.S: GOVERNMENT AGENT / DISTRICT SECRETARY/DIVISIONAL SECRETARY
Acct: ACCOUNTANT
L.O: LEGAL OFFICER
A.L.O: ASSISTANT LEGAL OFFICER
A.O.AD :ADMINISTRATIVE OFFICER
SEMV : SENIOR EMV
STO : STATISTICAL OFFICER
TA: TECHNICAL ASSISTANT
STAFF: INVESTIGATION AND DEVELOPMENT ASSISTANTS + MANAGEMENT ASSISTANTS + DRIVERS+ KKS
SUBJECT ABBR.:
D.L: DRIVING LICENSE
T: TECHNICAL
Tr. : TRANSFER
NP : NUMBER PLATES
E : EMMISON
NR : NEW REGISTRATION
RR1 : RECORD ROOM 1
P.D : PROJECT DIRECTOR (EMISION)
D.C : DEPUTY COMMISSIONER
A.D.P.M : ASSISTANT DATA PROCESSING MANAGER
S.O : SUPERVISING OFFICER
EMV : EXAMINER OF MOTOR VEHICLES
A.L.O : ASSISTANTS LEGAL OFFICER
IT : INFORMATION TECHNOLOGY
RR2 : RECORD ROOM 2
A.O.RR : ADMINISTRATIVE OFFICER RECORD ROOM
A.C : ASSISTANT COMMISSIONER
PRGM : PROGRAMMER
S.K : STORES KEEPER
STN : STATISTICIAN
A.O.DE : ADMINISTRATIVE OFFICER DEVELOPMENT
T.O : TECHNICAL OFFICER
T.O(E ): TECHNICAL OFFICER E
C.O : CORDINATING OFFICER

# 1. කාර්යමණ්ඩලය

## 1.1 මාණ්ඩලික නිළධාරී කාර්ය මණ්ඩලය - 2011

| | |
|---|---|
| ●මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් | - බී.ඩී.එල්. ධර්මප්‍රිය මයා |
| ●අතිරේක කොමසාරිස් (පාලන) | - ජී.එස්.කේ. කන්නන්ගර මයා |
| ●අතිරේක කොමසාරිස් (සංවර්ධන) | - යූ.කේ. බණ්ඩාර මයා |
| ●නියෝජ්‍ය කොමසාරිස් (සංවර්ධන) | - පී.එච්.සී. රත්නායක මයා |
| ●සහකාර කොමසාරිස් (වෙළඳ වා. පැ. ශාඛාව) | - කේ.ටී.එම්.එස්. සේරසිංහ මයා |
| ●සහකාර කොමසාරිස් (වේරහැර) | - ජී.එච්.ආර්. ගුණවර්ධන මයා |
| ●සහකාර කොමසාරිස් (තොරතුරු තාක්ෂණ) | - සමන්ති සේනානායක මෙනවිය |
| ●සහකාර කොමසාරිස් (කාර් පැවරුම් ශාඛාව) | - බී.ඒ. ප්‍රේමසිංහ මයා |
| ●සහකාර කොමසාරිස් (ත්‍රීවිල් න.ලි.ප) | -කේ.එච්.ජේ.එල්.සේනාරත්න මිය |
| ●සහකාර කොමසාරිස් (ත්‍රීවිල් පැවරුම් ශාඛාව) | - කේ.එස්.විජයකීර්ති මයා |
| ●සහකාර කොමසාරිස් (යතුරුපැදි පැවරුම් ශාඛාව) | - ආර්.ඒ.කේ. රේණුකා මිය |
| ●සහකාර කොමසාරිස් (වේරහැර ශාඛාව) | - සී.ඩබ්.කේ. ධර්මසේන මයා |
| ●සහකාර කොමසාරිස් (වෙළඳ වාහන න.ලි.ප) | - එන්.ආර්.කැකුලන්දල මයා |
| ●සහකාර කොමසාරිස් (වේරහැර ශාඛාව) | - ටී.එන්. ද සිල්වා මිය |
| ●ප්‍රධාන ගණකාධිකාරී | -ඩී.එස්.ආර්.කේ.ගුණතිලක මිය |
| ●ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන හා විමර්ශන) | - ආර්.කහඳුවආරච්චි මයා |
| ●ගණකාධිකාරී (ගෙවීම්) | -ඩී.කේ.එම්.ආර්. කුමාරසිරි මයා |
| ●ගණකාධිකාරී (ආදායම්) | -අයි.ජී.එස්.එස්.සිරිමාන්න මිය |
| ●පරිපාලන නිලධාරී (පාලන) | - ඩී.එම්. ගුණතිලක මයා |
| ●පරිපාලන නිලධාරී (සංවර්ධන) | -ඩී.ඩබ්.එස්. එන්. සිල්වා මිය |
| ●සහකාර දත්ත සැලසුම් කළමණාකරු | - පී.ඩබ්.පී.බී. ඊරියගම මයා |
| ●ජ්‍යොෂ්ඨ මෝටර් වාහන පරීක්ෂක | - එස්.ඒ. ප්‍රේමරත්න මයා |
| ●වැඩසටහන් සම්පාදක | - කේ.කේ.ආර්. සමරවීර මයා |

## 1.2 කාර්යමණ්ඩල තොරතුරු හා අනුමත සේවක සංඛ්‍යාව - 2011

### 1.2.1 වගුව

| තනතුරු නාමය | අයත් සේවය | සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|---|
| | | අනුමත | සිටින | පුරප්පාඩු |
| කොමසාරිස් ජනරාල් | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 01 | 01 | 00 |
| අතිරේක කොමසාරිස් (පාලන) | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 01 | 01 | 00 |
| අතිරේක කොමසාරිස් (සංවර්ධන) | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 01 | 01 | 00 |
| නියෝජ්‍ය කොමසාරිස් | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 03 | 01 | 02 |
| නියෝජ්‍ය කොමසාරිස් (කාර්මික) | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 01 | 00 | 01 |
| සහකාර කොමසාරිස් | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 15 | 09 | 06 |
| සහකාර කොමසාරිස් (තොරතුරු තාක්‍ෂණ) | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 01 | 01 | 00 |
| සහකාර කොමසාරිස් (කාර්මික) | ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවය | 01 | 00 | 01 |
| ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 01 | 01 | 00 |
| ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 03 | 03 | 00 |
| සහකාර දත්ත සැලසුම් කළමණාකරු | දෙපාර්තමේන්තු සේවය | 01 | 01 | 00 |
| පරිපාලන නිළධාරී | රාජ්‍ය කළමනාකරණ සේවය | 02 | 02 | 00 |
| භාෂා පරිවර්තක | භාෂා පරිවර්තන සේවය | 02 | 00 | 02 |
| පරිගණක වැඩසටහන් සම්පාදක | දෙපාර්තමේන්තු සේවය | 01 | 01 | 00 |
| ප්‍රධන මෝටර් වාහන පරීක්‍ෂක | ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවය | 12 | 05 | 07 |
| කළමනාකරණ සහකාර | රාජ්‍ය කළමනාකරණ සේවය | 293 | 249 | 44 |
| මෝටර් වාහන පරීක්‍ෂක | ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවය | 118 | 61 | 57 |
| අයවැය සහකාර | ආශ්‍රිත නිළධාරී සේවය | 01 | 00 | 01 |
| නීති සහකාර | ආශ්‍රිත නිළධාරී සේවය | 03 | 01 | 02 |
| විමර්ශන හා සංවර්ධන සහකාර | ආශ්‍රිත නිළධාරී සේවය | 34 | 33 | 01 |
| සංවර්ධන සහකාර (මාර්ග ආරක්‍ෂණ) | ආශ්‍රිත නිළධාරී සේවය | 25 | 25 | 00 |
| විමර්ශන සහකාර | ආශ්‍රිත නිළධාරී සේවය | 25 | 25 | 00 |
| මානව සම්පත් සහකාර | ආශ්‍රිත නිළධාරී සේවය | 20 | 20 | 00 |
| සංවර්ධන සහකාර | ආශ්‍රිත නිළධාරී සේවය | 215 | 15 | 200 |
| සංවර්ධන සහකාර (කාර්මික) | ආශ්‍රිත නිළධාරී සේවය | 04 | 03 | 01 |
| ගිණුම් සහකාර | ආශ්‍රිත නිළධාරී සේවය | 03 | 03 | 00 |
| වැඩසටහන් දත්ත පාලක | දෙපාර්තමේන්තු සේවය | 01 | 01 | 00 |
| පරිගණක පද්ධති ක්‍රියාකරු | දෙපාර්තමේන්තු සේවය | 03 | 02 | 01 |
| පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු | දෙපාර්තමේන්තු සේවය | 10 | 09 | 01 |
| සහකාර ලේඛණ භාර නිළධාරී | රාජ්‍ය කළමනාකරණ සේවය | 02 | 00 | 02 |
| දෙපාර්තමේන්තු ලිපිකරු | දෙපාර්තමේන්තු සේවය | 87 | 82 | 05 |
| පිළිගැනීමේ නිළධාරී | දෙපාර්තමේන්තු සේවය | 01 | 01 | 00 |
| රියදුරු | රියදුරු දෙපාර්තමේන්තු සේවය | 09 | 09 | 00 |
| කාර්යාල කාර්ය සහයක | කාර්යාල සේවක සෙවය | 71 | 69 | 02 |
| දෙපාර්තමේන්තු කම්කරු | දෙපාර්තමේන්තු සේවය | 42 | 28 | 14 |
| සනීපාරක්‍ෂක කම්කරු | දෙපාර්තමේන්තු සේවය | 06 | 02 | 04 |
| මුළු එකතුව | | **1019** | **665** | **354** |

**1.3 වසර 2011 දී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ස්ථාන මාරුවීම් ලබා පැමිණි මාණ්ඩලික නිළධාරීන් :-**

01. ටී.එන්.ද සිල්වා මිය - සහකාර කොමසාරිස් - 2011.07.01
(ශ්‍රී.ලං.ප.සේ. III පන්තිය)

02. ඩී.ඩබ්.එස්.එන් සිල්වා මිය - පරිපාලන නිළධාරී - 2011.01.03
රාජ්‍ය කළමනාකරණ සේවය

**1.4 වසර 2011 මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරුවීම් ලබා ගොස් ඇති මාණ්ඩලික නිළධාරීන් :-**

01. ඩී.එස්.පී. සේනාරත්න මහතා - නියෝජ්‍ය කොමසාරිස් - 2011.07.19
(ශ්‍රී.ලං.ප.සේ. I පන්තිය)

## 02. කාර්ය මණ්ඩල අභිප්‍රේරණය

### 2.1 අභ්‍යන්තර පුහුණු

| දිනය | වැඩමුළුව | සහභාගී වූ නිළධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| 2011.01.11 - 2011.01.12 | 2011 වර්ෂයේ ස්ථාන මාරු වීම් ලබා පැමිණි රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිළධාරීන් සඳහා වූ පුහුණු වැඩසටහන් | 30 |
| 2011.04.20 - 2011.04.25 | නව පත්වීම් ලබා පැමිණි රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිළධාරීන් සඳහා වූ පුහුණු වැඩසටහන් | 28 |

## 2.2 බාහිර පුහුණු

| කාල සීමාව | ආයතනය | පාඨමාලාව | සහභාගී වූ නිළධාරීන් |
|---|---|---|---|
| 2011.01.10 – 2011.01.14 | ශ්‍රී ලංකා ජර්මානු කාර්මික විද්‍යාලය | මෝටර් රථ පරීක්ෂක පුහුණුව | 12 |
| 2011.01.22 | තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ආයතනය | පරිගණක පාඨමාලාව | 04 |
| 2011.02.07 – 2011.02.12 | මිලෝදා ආයතනය | Government Payroll Management System | 02 |
| 2011.03.11 (එක් අවුරුදු) | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | කාර්යාල කළමනාකරණ ඩිප්ලෝමාව | 01 |
| 2011.09.13 | Skill Development Fund(Ltd) | Skills For Work Life | 02 |
| 2011.10.18 – 2011.10.19 | ශ්‍රී ලංකා පදනම් ආයතනය | රාජ්‍ය ආයතනවල නීතිමය කටයුතු කළමනාකරණය පිළිබඳ වැඩමුළුව | 01 |

## 03. පරිපාලනමය කටයුතු

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පරිපාලනමය ව්‍යුහය මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්තුමා ප්‍රමුඛ කරගත් පරිපාලන ධූරාවලියකින් සමන්විත වේ. මෙහි කටයුතු නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලය කේන්ද්‍ර කර ගනිමින් වේරහැර උප කාර්යාලය හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාල මඟින් මෙහෙයවීම සිදු කරයි.

සමස්ථ දෙපාර්තමේන්තුවට අදාළ පරිපාලනමය කටයුතු කොමසාරිස් ජනරාල් කාර්යාලය,ආයතන අංශය හා සංවර්ධන අංශය යන අංශ තුන මඟින් සිදු කෙරේ.

### 3.1 කොමසාරිස් ජනරාල් කාර්යාලය

| | | |
|---|---|---|
| කොමසාරිස් ජනරාල් | : බී.ඩී.එල්. ධර්මප්‍රිය මහතා (ශ්‍රී.ලං.ප.සේ. I) | |
| පෞද්ගලික සහකාර | : එච්.එස්. අබේතුංග මිය | |

| <u>කාර්ය මණ්ඩලය</u> | | <u>සංඛ්‍යාව</u> |
|---|---|---|
| සංවර්ධන සහකාර (කාර්මික) | : | 01 |
| පිළිගැනීමේ නිළධාරී | : | 01 |
| කාර්යාල කාර්ය සහයක | : | 02 |

<u>අංශයේ කාර්යභාරය</u>

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්තුමාගේ කාර්යභාරයන් සඳහා සහාය වීම මෙම අංශයේ ප්‍රධාන කාර්යය වේ.

### 3.2. ආයතන අංශය

| | |
|---|---|
| අතිරේක කොමසාරිස් | : ජී.එස්.කේ. කන්නන්ගර මහතා (ශ්‍රී.ලං.ප.සේ. I) |
| සහකාර කොමසාරිස් | : කේ.ටී.එම්.එස්.සේරසිංහ මහතා |
| පරිපාලන නිළධාරී | : ඩබ්.එම්.ගුණතිලක මහතා |
| අධීක්ෂණ නිළධාරී | : එම්.ප්‍රේමසිරි මහතා |

| <u>කාර්ය මණ්ඩලය</u> | | <u>සංඛ්‍යාව</u> |
|---|---|---|
| රාජ්‍ය කළමනාකරණ සහකාර | : | 13 |
| රියදුරු | : | 08 |
| කාර්යාල කාර්ය සහයක | : | 07 |
| සනීපාරක්ෂක කම්කරු | : | 04 |

<u>අංශයේ කාර්යභාරය</u>

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩලයේ ආයතන හා පරිපාලන කටයුතු ඉටු කිරීම සහ අනෙකුත් යටිතල පහසුකම් පවත්වාගෙන යාම හා නඩත්තු කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යය වන අතර ඒ අනුව කාර්ය මණ්ඩලය පත් කිරීම්, මාරු කිරීම්, උසස් කිරීම්, විශ්‍රාම ගැන්වීම, සේවා දීර්ඝ ලබා දීම හා විනය කටයුතු ද පෞද්ගලික ලිපිගොනු

පවත්වාගෙන යාම ද , ඊට අමතරව වැටුප් වර්ධක අනුමත කිරීම, විවිධ ණය වර්ග අනුමත කිරීම, අග්‍රහාර රක්ෂණ බිල්පත් නිරවුල් කිරීම, පරිපාලනමය කටයුතු වශයෙන් ද, ජලය, දුරකථන, විදුලි බිල්පත් පියවීම ද මෙම අංශය තුලින් සිදුකරනු ලබන මූලික කාර්යයන් වේ.

## 3.3 සංවර්ධන අංශය

| | |
|---|---|
| කොමසාරිස් (සංවර්ධන) | : යූ.කේ. බණ්ඩාර මහතා (ශ්‍රී.ලං.ප.සේ. I) |
| නියෝජ්‍ය කොමසාරිස් | : පි.එච්.සී. රත්නායක මහතා (ශ්‍රී.ලං.ප.සේ. I) |
| පරිපාලන නිළධාරී | : ඩී.ඩබ්.එස්.එන්. ද සිල්වා |
| අධීක්ෂණ නිළධාරී | : ජී. සපුතන්ත්‍රී මිය. |

| <u>කාර්ය මණ්ඩලය</u> | | <u>සංඛ්‍යාව</u> |
|---|---|---|
| විමර්ශන සහකාර | : | 01 |
| සංවර්ධන සහකාර | : | 01 |
| කාර්යාල කම්කරු | : | 01 |

<u>අංශයේ කාර්යභාරය</u>

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සියළුම ඉදිකිරීම් කටයුතු මෙහෙයවීම, ත්‍යාග හා දිරි දීමනා අරමුදල සම්බන්ධ මුලික කටයුතු මෙහෙයවීම, සේවක අභිප්‍රේරණය සඳහා අභ්‍යන්තර හා බාහිර පුහුණු කටයුතු, ප්‍රගති සමාලෝචන, අමාත්‍යාංශ හා වෙනත් අංශවලට යොමු කළ යුතු සියළුම ප්‍රගති වාර්තා, අයවැය වාර්තා,කාර්ය සාධන වාර්තා, ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම, ඵලදායිතා ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම ආදිය දැක්විය හැක.

## 3.4 ප්‍රධාන කාර්යාලයේ අංශ

1. කොමසාරිස් ජනරාල් කාර්යාලය
2. ආයතන ශාඛාව
3. සංවර්ධන ශාඛාව
4. ගිණුම් ශාඛාව
5. පරිගණක හා තොරතුරු තාක්ෂණ ශාඛාව
6. අභ්‍යන්තර විගණන හා විමර්ශන ශාඛාව

7. නීති ශාඛාව
8. සුබෝපබෝගී බදු ශාඛාව
9. ප්‍රධාන ලිපිකරු ශාඛාව
10. වෙළඳ වාහන නව ලියාපදිංචි ශාඛාව
11. ත්‍රීරෝද රථ නව ලියාපදිංචි ශාඛාව
12. යතුරුපැදි නව ලියාපදිංචි ශාඛාව
13. මෝටර් කාර් පැවරුම් ශාඛාව
14. වෙළඳ වාහන පැවරුම් ශාඛාව
15. ලොරි පැවරුම් ශාඛාව
16. බස් හා ඉඩම් වාහන පැවරුම් ශාඛාව
17. ත්‍රීරෝද රථ පැවරුම් ශාඛාව
18. යතුරුපැදි පැවරුම් ශාඛාව
19. කාර්මික ශඛාව
20. අංක තහඩු (කොළඹ) ශාඛාව
21. අංක තහඩු (පිටපළාත්) ශාඛාව
22. ලේඛණාගාර 1
23. ලේඛණාගාර 11
24. සංඛ්‍යාලේඛන ශාඛාව

### 3.5 උප කාර්යාලය

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වේරහැර උප කාර්යාලය නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු සහ සහකාර කොමසාරිස්වරුන් දෙදෙනෙකුගෙන් පාලනය වේ. කාර්යාලය මඟින් රියදුරු බලපත්‍ර නිකුත් කිරීමට අදාළ සියළු කාර්යයන් හා වාහන පරීක්‍ෂාව, බර සහතික නිකුත් කිරීම හා එයට අදාළ සියළු කටයුතු සිදුකරනු ලබයි.

### 3.6 දිස්ත්‍රික් කාර්යාල

මේ වන විට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාල සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ස්ථාන ගත කර ඇත. දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලට අනුබද්ධව හෝ වෙනත් නිශ්චිත භූමි භාගයක පිහිටුවා ඇති මෙම කාර්යාල ප්‍රධාන මෝටර් රථ පරීක්‍ෂකවරයෙකු මඟින් පාලනය වේ.

මෙම දිස්ත්‍රික් කාර්යාල මඟින් මූලික වශයෙන් රියදුරු බලපත්‍ර සඳහා අයදුම්පත් භාර ගැනීම, බලපත්‍ර නිකුත් කිරීමට අදාළ ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම සිදුකරනු ලබයි. මෙම කාර්යයන්ට අමතරව වෙන් කරන ලද අංක මත දිස්ත්‍රික්කයට අදාළ යතුරුපැදි නව ලියාපදිංචි කිරීම, දිස්ත්‍රික්කය තුල එම යතුරුපැදි පැවරීම, බර සහතික නිකුත් කිරීම හා කාර්මික සේවාවන්ට අදාළ කටයුතු ද, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කිරීම සඳහා පැවරුම් වලට අදාළ සියළු කටයුතු වෙනුවෙන් අයදුම්පත් භාර ගැනීම ද සිදුකරනු ලබයි.

**කාර්යක්ෂම මෝටර් රථ නියාමනයක් උදෙසා ක්‍රියාත්මක කළ වැඩසටහන්**

තිරසාර ජාතික ප්‍රතිපත්තීන් ගොඩනැගීම පෙරටු කර ගත් මහින්ද චින්තන ඉදිරි දැක්ම පාදක කර ගනිමින් ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ මෙම දෙපාර්තමේන්තුවට අදාල වැඩසටහන් වල ප්‍රගතිය පහත ආකාරයට සාරාංශ ගත කළ හැක.

- දෙපාර්තමේන්තුවේ ප්‍රධාන මහජන සේවාවන් වල සංඛ්‍යාත්මක ප්‍රගතිය.
- වාර්ෂික ක්‍රියාත්මක සැලැස්මේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය.
- අයවැය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද ප්‍රාග්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය.

## 04. දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන කාර්යයන්

මූලික වශයෙන් කාණ්ඩ පහක් යටතේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන කාර්යයන් පෙළ ගැසී ඇත. එනම්,

1. ධාවනය කල හැකි වාහන, මෝටර් රථ වාහන පනතේ නීතිරීති ප්‍රකාරව ලියාපදිංචි කිරීම.
2. වාහන අයිතිය පැවරීම ලියාපදිංචිය.
3. නිපුණතා සහතිකය මත රියදුරන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
4. කාර්මික සේවාව.
5. වායු විමෝචන පරීක්ෂණ කාර්යයන් අධීක්ෂණය කිරීම.

### 4.1 වාහන අයිතිය අළුතින් ලියාපදිංචි කිරීම.

ශ්‍රී ලංකාව තුළ පෙර ලියාපදිංචි සිදු කිරීමක් නොකරන ලද එනම් මෙරටට ආනයනය කරන ලද හෝ මෙරට නිෂ්පාදනය කරන ලද හෝ එකලස් කරන ලද වාහන ප්‍රථමවරට ලියාපදිංචි කිරීම මින් අදහස් වේ. වාහනයට අදාළ ලියාපදිංචි සහතික නිකුත් කිරීමේ දී අයදුම්කරු විසින් සම්පූර්ණ කරන ලද MTA 02 අයදුම් පත්‍රය, අදාළ රේගු ලියකියවිලි අයිතිකරුගේ සහතික කරන ලද ඡායාරූප දෙකක් හා හැඳුනුම්පත්‍රයේ ඡායා පිටපතක් සමඟ වාහනයේ ඉදිරි හා පැති

වෙනම දැක්වෙන ඡායාරූප දෙකක් ඉදිරිපත් කළ යුතුය. ලියාපදිංචියට අදාළ ලියාපදිංචි ගාස්තු ගෙවීමෙන් පසුව එක් දිනකින් ලියාපදිංචි කටයුතු අවසන් කර අදාළ ලියාපදිංචි සහතිකය නිකුත් කරනු ලබයි. වාහනයට අදාළ අංක තහඩු දින තුනක් (03) ඇතුලත නිකුත් කරනු ලබයි.

අළුතින් වාහන ලියාපදිංචි කරනු ලබන පුද්ගලයන්ගේ පහසුව සඳහා ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාවේ හා ජනශක්ති රක්‍ෂණ සමාගමේ සේවය දෙපාර්තමේන්තු භූමිය තුලදීම ලබා ගැනීමට පහසුකම් සපයා ඇති අතර පළමු ආදායම් බලපත්‍ර ලබා ගැනීමට බස්නාහිර පළාත් මෝටර් රථ කොමසාරිස් කාර්යාලයේ ඒකකයක් දෙපාර්තමේන්තු පරිශ්‍රයේ ක්‍රියාත්මක වේ.


2011.12.31 දිනට ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වූ මුළු මෝටර් වාහන ගහනය 4,479,732ක් වේ. එම ප්‍රමාණය වසර 2010 අවසානයේ දී පැවැති 3,954,311 තත්වයට වඩා 13.28%ක වැඩි වීමකි. 2011 වර්ෂය තුල නව ලියාපදිංචි මෝටර් වාහන සංඛ්‍යාව 525,421කි. වසර 2010 දී 359,243 වූ එම ප්‍රමාණය හා සැසඳීමේ දී වාහන නව ලියාපදිංචිය 46.3%කි. එම වැඩි වීම සලකා බැලීමේ දී වසර 2010 දී නව ලියාපදිංචියේ 76% ක වැඩි වීමට සාපේක්‍ෂව පහළ අගයක් ගනී. අය කරනු ලැබූ ආනයනික බදු ප්‍රතිශතය ඉහළයාම හා ලියාපදිංචි ගාස්තුවල සිදු වූ වර්ධනය එම පහල යාමට හේතු ලෙස දැක්විය හැක.
2005 වසරේ සිට ශ්‍රී ලංකාවේ වාර්ෂිකව ලියාපදිංචි වූ නව මෝටර් රථ ප්‍රමාණය හා වාහන ගහනය පහත ලෙස සංඛ්‍යාන සටහනකින් හා ප්‍රස්ථාරයකින් දැක්විය හැකිය.

**4.1.1** වගුව **:-** වාහන ගහනය

| වර්ෂය | නව ලියාපදිංචි වූ වාහන සංඛ්‍යාව | මුළු වාහන ගහනය |
|---|---|---|
| 2005 | 229,669 | 2,527,380 |
| 2006 | 300,522 | 2,827,902 |
| 2007 | 297,892 | 3,125,794 |
| 2008 | 265,199 | 3,390,993 |
| 2009 | 204,075 | 3,595,068 |
| 2010 | 359,243 | 3,954,311 |
| 2011 | 525,421 | 4,479,732 |

**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

**4.1.1** රූප සටහන




ශ්‍රී ලංකාවේ වාහන නව ලියාපදිංචිය සලකා බැලීමේ දී වාහන සංඛ්‍යාවේ වැඩිවීම වර්ෂයෙන් වර්ෂයට වැඩි වීමක් දක්නට ලැබුනද වසර 2006 හා 2009 යන කාල සීමාව තුල වාහන ලියාපදිංචියේ පසුබෑමක් දක්නට හැකි වූවත් වසර 2010 සිට නැවත එය ක්‍රමයෙන් වැඩි වෙමින් 2011 වසරේ පවතින 525,421ක් දක්වා වර්ධනය වී ඇත.

2010 හා 2011 වර්ෂය තුල වාහන කාණ්ඩය අනුව නව ලියාපදිංචි වූ වාහන සංඛ්‍යාව වාහන කාණ්ඩ අටක් (08)ක් යටතේ වර්ග කර ඇත. එනම්, මෝටර් කාර්, ත්‍රීරෝද රථ, මෝටර් සයිකල්, මෝටර් බස්, ද්විත්ව කාර්යය වාහන, මෝටර් ලොරි, ඉඩම්වාහන (ට්‍රැක්ටර්) සහ ඉඩම් වාහන (ට්‍රේලර්) ලෙස වේ. ඒ ඒ කාණ්ඩය යටතේ 2011 වසරේ ලියාපදිංචි වූ වාහන සංඛ්‍යාව හා එය 2010ට සාපේක්ෂව වර්ධනය වීමේ ප්‍රතිශතය පහත 4.1.2 වගුව මගින් දැක්විය ඇත.


**4.1.2** වගුව **:-** නව ලියාපදිංචි වාහන කාණ්ඩ

| වාහන පන්තිය | **2010** දෙසැම්බර් **31** දිනට වාහන ප්‍රමාණය | **2011** දෙසැම්බර් **31** දිනට වාහන ප්‍රමාණය | වැඩිවීම ප්‍රතිශතයක් ලෙසට |
|---|---|---|---|
| මෝටර් කාර් | 23,072 | 57,886 | 150.89% |
| ත්‍රීරෝද රථ | 85,648 | 138,426 | 61.62% |
| මෝටර් සයිකල් | 204,811 | 253,331 | 23.69% |
| මෝටර් බස් | 2,491 | 4,248 | 70.53% |
| ද්විත්ව කාර්යය වාහන | 11,712 | 33,518 | 186.18% |
| මෝටර් ලොරි | 11,845 | 14,818 | 25.09% |
| ඉඩම් වාහන(ට්‍රැක්ටර්) | 17,363 | 20,073 | 15.60% |
| ඉඩම් වාහන (ට්‍රේලර්) | 2,301 | 3,121 | 35.63% |
| **එකතුව** | **359,243** | **525,421** | **46.25%** |

මූලාශ්‍රය **:** මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

වගුවට අනුව මෝටර් කාර් නව ලියාපදිංචිය වසර 2011 දි 2010 සාපේක්ෂව වැඩි වී ඇත්තේ 150.89%කිනි. 2010ට සාපේක්ෂව ද්විත්ව කාර්යය වාහන 186.18% කින් වර්ධනය වී ඇත. තෙවන ස්ථානයට ඉහළ වර්ධන අනුපාතයක් පෙන්වන්නේ මෝටර් බස් වාහන නව ලියාපදිංචියයි. නමුත් එය ද පෙර වසර හා සැසඳීමේ දි මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සමස්ථ වාහන නව ලියාපදිංචිය 46.25%ක් ලෙස පහළ වර්ධන අනුපාතයක් පෙන්නුම් කරයි.

**4.1.2** රූප සටහන





**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

වසර තුල අළුතින් ලියාපදිංචි වන මෙම වාහන ඉන්ධන භාවිතය අනුව ප්‍රධාන වශයෙන් කාණ්ඩ 03 ක් යටතේ වර්ග කල හැක. එනම්,

- පෙට්‍රල් භාවිතා කරන වාහන
- ඩීසල් භාවිතා කරන වාහන
- වෙනත්


2011 වසර තුල ඉහත කාණ්ඩ යටතේ අළුතින් ලියාපදිංචි වූ වාහන අතර 431,823 පෙට්‍රල් භාවිතා කරන වාහන ලෙස ද , වාහන 85,540 ඩීසල් භාවිතා කරන වාහන ලෙස ද ලියාපදිංචි වී ඇත. ඊට අමතරව වෙනත් භාවිතයන් අනුව පෙට්‍රල්/ ඉලෙක්ට්‍රිකල් වාහන 4,415ක් ද ඉලෙක්ට්‍රිකල් වාහන 27ක් වැනි සුළු ප්‍රමාණයක් ද ඉන්ධන භාවිතා නොකරන වාහන 3,616ක් ලෙස ලියාපදිංචි වී ඇත.

**4.1.3 රූප සටහන**




මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

**4.1.4 රූප සටහන**




මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

2011 වසර තුලදී ශ්‍රී ලංකාව තුල අළුතින් ලියාපදිංචි කරන ලද වාහන ආනයනය කරනු ලැබූ රටවල් සලකා බැලීමේ දී 525,421ක් වූ නව ලියාපදිංචි වාහන වලින් 413,741 (79%)ක් ඉන්දියාවෙන් ද 58,369 (11%)ක් ජපානයෙන් ද ආනයනය කරන ලද අතර 32,930 (6%)ක් චීනයෙන් ආනයනය කර ඇත. එම ප්‍රමාණය ප්‍රතිශතාත්මකව විශ්ලේෂණය කිරීමේ දී දැකිය හැකි වන්නේ 79%ක් වැනි විශාල වාහන ප්‍රමාණයක් ඉන්දියාවෙන් ආනයනය කර ඇති බවයි. එම දත්ත 4.1.3 ප්‍රස්ථාර සටහන තුළින් සාරාංශ කර දැක්විය හැකිය.

දෙපාර්තමේන්තුවේ වාහන අළුතින් ලියාපදිංචි කිරීමේ දී එම වාහන වර්ග අනුව අංශ තුනක් (03) යටතේ ලියාපදිංචිය සිදු කරනු ලබයි. එනම්,

1. වෙළඳ වාහන නව ලියාපදිංචි ශාඛාව
   (කාර්,බස්, ලොරි, ද්විත්ව කාර්යය වාහන, සින්ගල් කැබ්, ප්‍රයිමුවර්, ට්‍රැක්ටර්, අවමංගල්‍ය රථ, ගිලන් රථ)
2. ත්‍රීරෝද රථ නව ලියාපදිංචි ශාඛාව
3. යතුරුපැදි නව ලියාපදිංචි ශාඛාව

### 4.1.1 වෙළඳ වාහන නව ලියාපදිංචි ශාඛාව

සහකාර කොමසාරිස් : එන්.ආර්. කැකුලන්දල මහතා

අධීක්ෂණ නිළධාරී : ආර්. ඊෂ්වරලිංගම් මහතා

| <u>කාර්ය මණ්ඩලය</u> | | <u>සංඛ්‍යාව</u> |
|---|---|---|
| රාජ්‍ය කළමනාකරණ සහකාර | : | 22 |
| විමර්ශන හා සංවර්ධන සහකාර | : | 01 |
| විමර්ශන සහකාර | : | 04 |
| මානව සම්පත් සහකාර | : | 01 |
| දත්ත සටහන් ක්‍රියාකරු | : | 01 |
| දෙපාර්තමේන්තු ලිපිකරු | : | 03 |
| කාර්යාල කාර්ය සහයක | : | 04 |

<u>අංශයේ කාර්යභාරය</u>

විශේෂ කාර්යය වාහන, ද්විත්ව කාර්යය වාහන, මෝටර් ලොරි, මෝටර් කාර් හා ත්‍රිවිධ හමුදා මඟින් මිලදී ගන්නා , රාජසන්තක කර වෙන්දේසි කරන ලද වාහන ලියාපදිංචි කර ලියාපදිංචි සහතික නිකුත් කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරයයි.ඊට අමතරව අංක 18,19,300,301,302 දරණ ලියාපදිංචි අංක සහිත වාහන සඳහා ගාස්තු අයකර ඉංග්‍රීසි අක්ෂර ලබා දීම, අර්ධ සුඛෝපභෝගි, ද්විත්ව කාර්යය සුඛෝපභෝගි වාහන බදු අය කිරීම සඳහා ලියාපදිංචි වීම මෙන්ම රජයේ ප්‍රතිපත්ති අනුව වාහන සඳහා ඉදිරි අංක වෙන් කිරීම හා ඒ සඳහා ගාස්තු අයකිරීම සිදුකරනු ලබයි.

වසර 2011දී මෙම අංශය මඟින් මෝටර් වාහන 114,905ක් ලියාපදිංචි කටයුතු සිදුකර ඇත. වසර 2010 දී එම ප්‍රමාණය 119,163ක් වී ඇති අතර එම වසරට සාපේක්ෂව 2011 වසරේ දී ලියාපදිංචි වූ නව වෙළඳ වාහන සංඛ්‍යාව 3.57%කින් වර්ධනය අඩු වී ඇත.

### 4.1.2 ත්‍රීරෝද රථ නව ලියාපදිංචි ශාඛාව

සහකාර කොමසාරිස් : කේ.එච්.ජේ ලංකාදරී සේනාරත්න මිය

අධීක්ෂණ නිළධාරී : එච්. විමලරත්න මහතා

| <u>කාර්ය මණ්ඩලය</u> | | <u>සංඛ්‍යාව</u> |
|---|---|---|
| රාජ්‍ය කළමනාකරණ සහකාර | : | 04 |
| විමර්ශන සහකාර | : | 02 |

දෙපාර්තමේන්තු ලිපිකරු : 04

කාර්යාල කාර්ය සහයක : 01

කාර්යාල කම්කරු : 01

<u>අංශයේ කාර්යභාරය</u>


මෙම අංශයේ ප්‍රධාන කාර්යභාර්ය වශයෙන් මෙතෙක් ලියාපදිංචි නොවූ ත්‍රිරෝද රථ පළමු වරට ලියාපදිංචි කිරීම සිදු කරනු ලබයි. ඊට අමතරව තානාපති කාර්යාල හා රාජ්‍ය නොවන සංවිධානයන් හි වාහන පැවරීම ලියාපදිංචිය, එම වාහන වල ලියාපදිංචිය අවලංගු කිරීම සහ එම වාහන රටින් බැහැර ගෙන යාමට අදාල කාර්යන් ඉටුකරයි.

**4.1.3** වගුව **:-** වසර **2005** සිට ත්‍රිරෝද රථ නව ලියාපදිංචියේ ප්‍රවණතාවය

| වර්ෂය | නව ලියාපදිංචි වූ ත්‍රිරෝද රථ ප්‍රමාණය |
|---|---|
| 2005 | 41,085 |
| 2006 | 64,466 |
| 2007 | 43,068 |
| 2008 | 44,804 |
| 2009 | 37,364 |
| 2010 | 85,648 |
| 2011 | 138,426 |

මූලාශ්‍රය **:** මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

**4.1.4** රූප සටහන




මූලාශ්‍රය **:** මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු

### 4.1.3 යතුරුපැදි නව ලියාපදිංචි

කොමසාරිස් : යු.කේ. බණ්ඩාර මහතා

අධීක්ෂණ නිළධාරී : එස්.පී. රූපානන්ද මහතා

| <u>කාර්ය මණ්ඩලය</u> | | <u>සංඛ්‍යාව</u> |
|---|---|---|
| රාජ්‍ය කළමනාකරණ සහකාර | : | 19 |
| විමර්ශන හා සංවර්ධන සහකාර | : | 01 |
| දත්ත සටහන් ක්‍රියාකරු | : | 01 |
| දෙපාර්තමේන්තු ලිපිකරු | : | 01 |
| කාර්යාල කාර්ය සහයක | : | 02 |
| සනීපාරක්ෂක කම්කරු | : | 01 |

<u>අංශයේ කාර්යභාරය</u>


ශ්‍රී ලංකාව තුල මෙතෙක් ලියාපදිංචි නොකළ නව යතුරුපැදි ලියාපදිංචි කිරීම අංශයේ ප්‍රධාන කාර්යභාරය වන අතර දිස්ත්‍රික් කාර්යාල වල යතුරුපැදි නව ලියාපදිංචි කිරීම සඳහා අංක ලබා දීම, දිස්ත්‍රික් කාර්යාල වලින් ලියාපදිංචි කරනු ලබන යතුරුපැදි වල දත්ත පරිගණක පද්ධතියට ඇතුලත් කිරීම, උතුරු නැගෙනහිර පළාත් දිස්ත්‍රික් කාර්යාල වල ලියාපදිංචි කර ප්‍රධාන කාර්යාල වෙත එවනු ලබන MTA 02 ආකෘතිපත් වලට අදාල ලියාපදිංචි සහතිකපත් නිකුත් කර යැවීම යනාදිය අංශයේ ප්‍රධාන කාර්යයට අමතරව ක්‍රියාත්මක වේ.

**4.1.4** වගුව **:-** වසර **2005** සිට ලියාපදිංචි වූ නව යතුරුපැදි සංඛ්‍යාවේ වර්ධනය

| වර්ෂය | ලියාපදිංචි වූ නව යතුරුපැදි සංඛ්‍යාව | මුළු වාහන ගහනයට දැක්වූ දායකත්වය |
|---|---|---|
| 2005 | 130,696 | 1,265,514 |
| 2006 | 156,626 | 1,422,140 |
| 2007 | 182,508 | 1,604,648 |
| 2008 | 155,952 | 1,760,600 |
| 2009 | 135,421 | 1,896,021 |
| 2010 | 204,811 | 2,100,832 |
| 2011 | 253,331 | 2,354,163 |

මූලාශ්‍රය **:** මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

**4.1.5 රූප සටහන**




**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

2011වසර අවසන් වන විට අළුතින් ලියාපදිංචි කරන ලද යතුරුපැදි සංඛ්‍යාව 253,331වන අතර අනෙකුත් සෑම වර්ෂයකම මෙන්ම මෝටර් වාහන ගහනය සඳහා ඉහළ දායකත්වයක් යතුරුපැදි නව ලියාපදිංචිය තුලින් සපයා ඇත. 2011 වසර තුල සමස්ථ මෝටර් වාහන ගහනය සඳහා යතුරුපැදි තුලින් ලබා දී ඇති දායකත්වය 2,354,163ක් වැනි ඉහළ ප්‍රමාණයකි. එය සමස්ථ මෝටර් රථ ගහනයෙන් 52.56% ක් වැනි ඉහළ ප්‍රතිශතයකි. මෙම යතුරුපැදි නව ලියාපදිංචිය වසර 2010ට සාපේක්ෂව 23.69% ක වැඩි වීමක් වුවද 2009 ට සාපේක්ෂව 2010 දී වැඩි වූ 51.2% සමඟ සසදා බැලීමේ දී මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කරයි.

## 4.2 වාහන හිමිකම් මාරු කිරීම (පැවරීම)

වාහන පැවරීම යන්නෙහි ප්‍රධාන අදහස වන්නේ මෝටර් රථ දෙපාර්තමේන්තුව තුල මූලික ලියාපදිංචිය සිදුකර ඇති සියළුම වාහන වල අයිතිය පැවරීම ලියාපදිංචි කිරීමයි. මෙම වාහන පැවරීමේ කාර්යය සඳහා ඒ ඒ වාහන වර්ගය අනුව පැවරුම් අංශ හයක් යටතේ ක්‍රියාත්මක වේ. එනම්,

- ලොරි පැවරුම් අංශය
- කාර් පැවරුම් අංශය
- වෙළඳ වාහන අංශය

- ත්‍රිරෝද රථ පැවරුම් අංශය
- යතුරුපැදි පැවරුම් අංශය
- බස් හා ඉඩම් වාහන පැවරුම් අංශය

### 4.2.1 පැවරුම් අංශවල කාර්යභාරය

මෙම සෑම අංශයක්ම ඒ ඒ අංශයන්ට අදාළ සාමාන්‍ය සේවා හා එක්දින සේවා කටයුතු ක්‍රමවත්ව ඉටුකරනු ලබන අතර මෙම සියළුම අංශයන්ගේ කාර්යභාරය පොදුවේ පහත පරිදි දැක්විය හැක.

- ❖ පැවරීම ලියාපදිංචි කිරීම
- ❖ පරම අයිතිය හෝ උකසක් සහිතව පැවරීම ලියාපදිංචි කිරීම
- ❖ පරම අයිතිය හෝ උකසක් අවලංගු කර පැවරීම ලියාපදිංචි කිරීම
- ❖ ලියාපදිංචි සහතිකය සහ වාහන හැදුනුම්පතේ අනු පිටපත් නිකුත් කිරීම
- ❖ විධිමත් අයුරෙන් සිදු කරන භෞතික වෙනස්කම් මෙන්ම ලේඛනමය වෙනස්කම් ද ලියාපදිංචි සහතිකයේ ඇතුලත් කිරීම
  උදා :- එංජින් අංකය, වර්ණය, ලිපිනය
- ❖ නව ඉං ශ්‍රී සි අක්ෂර සහිත වාහන වල අංක තහඩු හා ස්ටිකර් වල අනු පිටපත් නිකුත් කිරීම සඳහා දත්ත පරිගණක ගත කිරීම
- ❖ පැවරීමක් සඳහා පැවරුම් ශාඛාවට අයදුම්පත් ඉදිරිපත් කර ඇති වාහන සඳහා ආදායම් බලපත්‍රය ලබා ගැනීමට අවශ්‍ය MTA-11 ලේඛන සනාත කර නිකුත් කිරීම
- ❖ නෛතික කටයුතු සඳහා අවශ්‍ය වන සහතික කරන ලද පරිගණක උද්ධෘත නිකුත් කිරීම හා ලැබෙන විරෝධතා සටහන් කර ගැනීම

### 4.2.2 පැවරුම් අංශවල නිළධාරී සංයුතිය

ඒ ඒ අංශයන්ට අදාළ ඉහත කාර්යන් ඉටු කිරීමේ දී අදාළ අංශයේ කාර්ය මණ්ඩලය වගකීමෙන් එම කාර්යන් සඳහා බැදි සිටින අතර ඒ ඒ පැවරුම් අංශවල නිළධාරී සංයුතිය පහත ලෙස සාරාංශ කළ හැක.

**4.2.1** වගුව :- පැවරුම් අංශවල නිළධාරී සංයුතිය


| අංශය | මාණ්ඩලික නිළධාරී | අධීක්ෂණ නිළධාරී | විමර්ශන හා සංවර්ධන සහකාර | දත්ත/ පද්ධති සටහන් ක්‍රියාකරු | රාජ්‍ය කළ. සහකාර | දෙපා. ලිපිකරු | කා.කා. ස/ දෙපා. කම්කරු |
|---|---|---|---|---|---|---|---|
| යතුරුපැදි පැවරුම් | ආර්.ඒ.කේ.රේණුකා මිය (සහකාර කොමසාරිස්) | ඒ.එම්. සෝමරත්න මහතා | 06 | 02 | 06 | 06 | 04 |
| වෙළඳ වාහන පැවරුම් | කේ.එම්.එස්.සේරසිංහ මහතා (සහකාර කොමසාරිස්) | බී.ජී. සිරිපාල මහතා | 01 | - | 07 | 08 | 02 |
| ලොරි පැවරුම් | ජී.එස්.කේ. කන්නන්ගර මහතා (අතිරේක කොමසාරිස්) | කේ.එම්. එල්.බී. හේරත් මහතා | 03 | - | 03 | 05 | 01 |
| කාර් පැවරුම් | රංජිත් ගුණවර්ධන මයා (සහකාර කොමසාරිස්) | ආර්.වී. උපාලි මහතා | 07 | - | 13 | 07 | 03 |
| ත්‍රිරෝද රථ පැවරුම් | කේ.එස්.විජයකීර්ති මයා (සහකාර කොමසාරිස්) | කේ.පී.පී. බණ්ඩාර මහතා | 03 | - | 05 | 05 | 02 |
| බස් හා ඉඩම් වාහන පැවරුම් | නිරෝෂනී ද සිල්වා මිය. (සහකාර කොමසාරිස්) | ඩබ්.කේ. කුමාරදාස මහතා | 01 | - | 02 | 03 | 01 |

**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

## 4.2.3 පැවරුම් අංශවල කාර්යන්ගේ ප්‍රගතිය

වසර 2011 දී වාහන පැවරුම් සම්බන්ධයෙන් සලකා බැලීමේ දී සමස්ථ පැවරුම් සංඛ්‍යාව 288,784 ක් වී ඇත.වාහන පැවරුම්වල සිදු වූ වර්ධනයේ ප්‍රවනතාවය වසර 2009 සිට පහත ප්‍රස්ථාරය තුලින් දැක්විය හැක.

**4.2.1** රූප සටහන :- වාහන පැවරුම්වල ප්‍රවනතාව




**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**


සංඛ්‍යා සටහනට අනුව වසර 2010 දී සිදුකරන ලද 245,768 පැවරුම් සංඛ්‍යාවට සාපේක්ෂව 17.50%ක වර්ධනයක් පෙන්නුම් කරමින් සමස්ථ පැවරුම් සංඛ්‍යාව වන 288,784 මට්ටමට ළඟා වී ඇත. එම වර්ධනය 2010 දී සිදු වූ 20%ක වර්ධනයට සාපේක්ෂව සලකා බැලීමේ දී මන්දගාමී වර්ධනයකි. එම පැවරුම් ප්‍රමාණය ඒ ඒ වාහන කාණ්ඩ අනුව පහත ලෙස වෙන් කර දැක්විය හැක.

**4.2.2 වගුව :- වාහන පැවරුම් සංයුතිය**

| වාහන වර්ගය | 2010 | 2011 |
|---|---|---|
| ලොරි පැවරුම් | 34,653 | 44,936 |
| කාර් පැවරුම් | 51,490 | 66,297 |
| වෙළඳ වාහන | 39,644 | 47,793 |
| ත්‍රිරෝද රථ පැවරුම් | 57,348 | 63,194 |
| යතුරුපැදි පැවරුම් | 40,906 | 39,401 |
| බස් පැවරුම් | 14,366 | 17,720 |
| ඉඩම් වාහන පැවරුම් | 7,361 | 9,443 |
| **එකතුව** | **245,768** | **288,784** |

**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

**4.2.2 රූප සටහන**




**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

වසර 2010 දී වාහන පැවරීම සම්බන්ධයෙන් ත්‍රිරෝද රථ පැවරුම් ඉහළ අගයක් ලබා ගත්ත ද වසර 2011 දී ඉහළ පැවරුම් සංඛ්‍යාවක් සිදු වී ඇත්තේ මෝටර් කාර් තුළින්ය. එහි ප්‍රතිඵලයක් ලෙස ත්‍රිරෝද රථ පැවරුම් තුන් වන ස්ථානයට පත්වී ඇති අතර සමස්ථ වාහන පැවරුම් ගහනයේ අඩුම වැදගත්කම හිමිකරගෙන ඇත්තේ බස් පැවරුම් හා ඉඩම් වාහන පැවරුම් ය.

**4.3 වේරහැර උපකාර්යාලය.**

වේරහැර උප කාර්යාලයේ කටයුතු පහත සඳහන් අංශ ඔස්සේ සිදුකරනු ලබයි.

1. ආයතන ශාඛාව
2. නව රියදුරු බලපත්‍ර ශාඛාව
3. රියදුරු බලපත්‍ර බලාත්මක කිරීමේ ශාඛාව
4. රියදුරු බලපත්‍ර අනුපිටපත් ශාඛාව
5. කාර්මික ශාඛාව
6. වාහන පරීක්ෂා කිරීමේ ශාඛාව
7. සරප් ශාඛාව
8. තැපැල් ශාඛාව
9. ලේඛණාගාර I/ II
10. විභාග ශාලාව

**4.3.1 කාර්ය මණ්ඩලය**

සහකාර කොමසාරිස් : ජී.එච්.ආර්. ගුණවර්ධන මහතා
: එන්.පී. අමරතුංග මහතා

| <u>කාර්ය මණ්ඩලය</u> | | <u>සංඛ්‍යාව</u> |
|---|---|---|
| අධීක්ෂණ නිළධාරී | : | 10 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | : | 27 |
| විමර්ශන හා සංවර්ධන සහකාර | : | 05 |
| සංවර්ධන සහකාර(මාර්ග ආරක්ෂණ) | : | 04 |
| සංවර්ධන සහකාර | : | 01 |
| මානව සම්පත් සහකාර | : | 01 |
| දත්ත සටහන් ක්‍රියාකරු | : | 02 |
| දෙපාර්තමේන්තු ලිපිකරු | : | 22 |
| මෝටර් රථ පරීක්ෂක | : | 34 |
| රියදුරු | : | 01 |
| කාර්යාල කාර්ය සහයක | : | 03 |
| කාර්යාල කම්කරු | : | 07 |
| ආදේශක | : | 02 |

**4.3.2 රියදුරු බලපත්‍ර නිකුත් කිරීම.**

රියදුරු බලපත්‍ර නිකුත් කිරීම හා ඒ හා සම්බන්ධ සියළු කාර්යන් ප්‍රධාන වශයෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ උපකාර්යාලය වන වේරහැර කාර්යාලය මගින් සිදු වුවත් එම කටයුතු හම්බන්තොට අනුරාධපුරය ඇතුළු අනිකුත් දිස්ත්‍රික් කාර්යාල වලට ද ව්‍යාප්ත කිරීමට අපේක්ෂාවෙන් සිටී. මෙම රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියා පිළිවෙල දෙපාර්තමේන්තුව ආරම්භයේ සිට අවස්ථා ගණනක දී කාලෝචිතව විකාශනය වෙමින් වර්තමානයේ නිකුත් කරනු ලබන ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතු නව ස්මාර්ට් කාඩ් රියදුරු බලපත්‍රය දක්වා විකාශනය වී ඇත.මෙම ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතු ස්මාර්ට් කාඩ් රියදුරු බලපත්‍රය ව්‍යාජ ලෙස මුද්‍රණය කිරීම වැළැක්වීම සඳහා උසස් තත්වයේ ආරක්ෂණ උපක්‍රම භාවිතා කර ඇති අතර මෙහි බලපත්‍ර දරන්නාගේ රුධිර ගණය ද ඇතුලත් තර ඇත. මෙම රියදුරු බලපත්‍රය නිකුත් කිරීමේ දී ප්‍රධාන වශයෙන් ක්‍රම දෙකක් භාවිතා කරයි. එනම්,

1. On Line (වේරහැර කාර්යාලය මඟින් අනුගමනය කරයි)
2. Off Line (දිස්ත්‍රික් කාර්යාල මඟින් අනුගමනය කරයි)

2011 වසර තුල නිකුත් කරන ලද රියදුරු බලපත්‍ර වල කාර්තුමය දත්ත පහත වගුව තුලින් දැක්විය හැකිය.

**4.3.1** වගුව


| වර්ගය | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තුන්වන කාර්තුව | හතරවන කාර්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| පරිවර්තන | 35,690 | 31,764 | 37,582 | 56,059 | 161,095 |
| සංශෝධන | 253 | 323 | 557 | 768 | 1,901 |
| අනු පිටපත් | 5,836 | 6,109 | 7,571 | 10,206 | 29,722 |
| වාහන පංති එකතු කිරීම | 4,375 | 4,004 | 5,149 | 9,645 | 23,173 |
| විදේශ රියදුරු බලපත්‍ර පරිවර්තන | 738 | 731 | 1,151 | 1,281 | 3,901 |
| නව රියදුරු බලපත්‍ර | 16,250 | 14,553 | 20,030 | 35,354 | 86,187 |
| අළුත් කිරීම | - | - | - | 6 | 6 |
| **මුළු එකතුව** | **63,142** | **57,484** | **72,040** | **113,319** | **305,985** |

**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

ඉහත 4.3.1 වගුවට අනුව හතර වන කාර්තුවේ 35,354 ක් වන නව රියදුරු බලපත්‍ර ප්‍රමාණයක් නිකුත් කිරීම සම්බන්ධයෙන් සලකා බැලීමේ දී එම අගය ඔක්තෝම්බර් මස 6,198ක් ද

නොවැම්බර් මස 6,488ක් හා දෙසැම්බර් මාසයේ 22,668 ක් යන ඉහළ අගයක් එකතු වීම තුලින් සැකසී ඇත. වර්ෂය පුරාවටම 5000 – 7000 යන සංඛ්‍යා පරාසය තුල නිකුත් කල නව රියදුරු බලපත්‍ර ප්‍රමාණය දෙසැම්බර් මස ඉහළ අගයක් වාර්තා වූයේ ගම්පහ, හම්බන්තොට, කුරුණෑගල යන දිස්ත්‍රික් කාර්යාල නිකුත් කළ රියදුරු බලපත්‍ර වල අගය ද එකතු වීමෙනි.

**4.3.1 රූප සටහන:- නිකුත් කළ රියදුරු බලපත්‍ර ප්‍රමාණය**




**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

## 4.4 කාර්මික සේවාව.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන කාර්මික සේවාවන්ට අදාළ කටයුතු කාර්මික ශාඛාව මඟින් සිදුකරනු ලබන අතර එම කාර්යය ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ මෝටර් රථ පරීක්‍ෂකවරු විසින් සිදුකරනු ලබයි. සහකාර කොමසාරිස් (කාර්මික), ප්‍රධාන මෝටර් රථ පරීක්‍ෂකවරු 05ක් හා මෝටර් රථ පරීක්‍ෂකවරු 61කින් සමන්විත වේ. කාර්මික සේවය සඳහා මෙම මෝටර් රථ පරීක්‍ෂකවරුන් ප්‍රධාන කාර්යාලයේ, වේරහැර උපකාර්යාලයේ හා සියලු දිස්ත්‍රික් කාර්යාල වලට අනුයුක්ත කර ඇත.

කාර්මික සේවාව සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලයෙන් වේරහැර උපකාර්යාලයෙන් හා සියළු දිස්ත්‍රික් කාර්යාල වලින් සිදු කරන කාර්යන් පොදුවේ පහත ලෙස දැක්විය හැක.

- මෝටර් වාහන පනත අනුව නීතිරීති රෙගුලාසි සකස් කිරීම හා සංශෝධන කටයුතු.
- රියදුරු බලපත්‍ර සම්බන්ධ ලිඛිත හා ප්‍රායෝගික පරීක්‍ෂණ පැවැත්වීම.
- වාහන පරීක්‍ෂාකර බර සහතික නිකුත් කිරීම, සංශෝධන සහතික, අනන්‍යතා සහතික නිකුත් කිරීම.
- රජයේ වාහන සඳහා යෝග්‍යතා සහතික නිකුත් කිරීම.
- ටෙන්ඩර් මණ්ඩල සඳහා සහභාගී වීම, වාහන අවලංගු කිරීම, වෙන්දේසියට පෙර තක්සේරු කිරීම් සඳහා අදාළ මණ්ඩල වලට සහභාගී වීම.

- කාර්මික ගරාජ ලියාපදිංචි කිරීම් සහ වාර්ෂික බලපත්‍ර අළුත් කිරීම.
- CMT වැසි අංක, ට්‍රේලර වැසි අංක නිකුත් කිරීම.
- රියදුරු උපදේශක පාඨමාලා සහ අනෙකුත් පුහුණු පාඨමාලා සකස් කර ක්‍රියාත්මක කිරීම.
- බරපතල අනතුරු සම්බන්ධ වාහන පරීක්‍ෂා කර නිරීක්‍ෂණ අධිකරණය වෙත වාර්තා කිරීම.

ප්‍රධාන කාර්යාලය ඇතුළු අනිකුත් කාර්යාල වලින් සිදුකරනු ලබන කාර්මික සේවාවන් ප්‍රධාන කාණ්ඩ විස්සක් (20) යටතේ වර්ග කර දැක්විය හැකි අතර එම එක් එක් කාණ්ඩයන්ට අදාළ සංඛ්‍යාත්මක දත්ත පහත 4.3.2 වගුව මඟින් සාරාංශ කර පහත පරිදි දැක්විය හැක.

**4.4.1** වගුව

| | **කාර්යය** | **ප්‍රමාණය - 2011** |
|---|---|---|
| 01 | රියදුරු බලපත්‍ර ලබා ගැනීමේ ලිඛිත පරීක්‍ෂණ පැවැත්වීම | 77,996 |
| 02 | රියදුරු බලපත්‍ර ලබා ගැනීමේ ප්‍රායෝගික පරීක්‍ෂණ පැවැත්වීම | 76,539 |
| 03 | අංක තහඩු නිකුත් කිරීම (කොළඹ) | 356,856 |
| 04 | අංක තහඩු නිකුත් කිරීම (පිට පළාත්) | 183,874 |
| 05 | ගරාජ, නව වෙළඳ ආයතන පරීක්‍ෂා කිරීම | 243 |
| 06 | ගරාජ, නව වෙළඳ ආයතන ලියාපදිංචි කිරීම | 243 |
| 07 | ගරාජ, නව වෙළඳ ආයතන අළුත් කිරීම | 805 |
| 08 | රියදුරු පාසල් පරීක්‍ෂා කිරීම | 46 |
| 09 | මූලාකෘති නිකුත් කිරීම | 375 |
| 10 | C.M.T. වැසි අංක නිකුත් කිරීම | 25 |
| 11 | ට්‍රේලර් වැසි අංක නිකුත් කිරීම | 108 |
| 12 | රේගු වෙන්දේසි වාහන සඳහා C.M.T. වැසි අංක නිකුත් කිරීම | 3,888 |
| 13 | යතුරුපැදි පරීක්‍ෂා කිරීම | 2,112 |
| 14 | නව යතුරුපැදි පරිගණක ගත කිරීම | 253,376 |
| 15 | බර සහතික නිකුත් කිරීම | 12,514 |
| 16 | අනන්‍යතා සහතික නිකුත් කිරීම | 1,754 |
| 17 | තහනම් නියෝග නිකුත් කිරීම | 1,765 |
| 18 | තහනම් නියෝග ඉවත් කිරීම | 1,984 |
| 19 | රිය අනතුරු පරීක්‍ෂා කිරීම | 4,751 |
| 20 | විශේෂ රාජකාරී සඳහා සහභාගී වීම | 222 |

**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

**4.5 වායු විමෝචන පරීක්ෂණ කාර්යයන් නියාමනය කිරීම.**

පරිසර දූෂණයට ඉවහල් වන වාහන වලින් පිටවන දුම පාලනය කිරීමේ පරමාර්ථයෙන් 2008 ජනවාරි මස 25වන දින නිකුත් කරන ලද අංක 1533/17 දරණ අතිවිශේෂ ගැසට් නියෝගය සහ 2009 අංක 08 මෝටර් වාහන (සංශෝධන) පනත අනුව 2008 නොවැම්බර් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වායු විමෝචන පරීක්ෂණ කටයුතු ආරම්භ කරන ලදි.

වායු විමෝචන පරීක්ෂණ සහතික නිකුත් කිරීම සඳහා පුද්ගලික සමාගම් දෙකක් (02) පත්කර ඇති අතර එම සමාගම් විසින් නිකුත් කරනු ලබන සහතිකය වසරක් සඳහා වලංගු වේ. වායු විමෝචන පරීක්ෂණ සහතිකය වාහනයේ වාර්ෂික ආදායම් බලපත්‍රය ලබා ගැනීමේ දී අනිවාර්ය ඉදිරිපත් කළ යුතු වේ.

වායු විමෝචන පරීක්ෂණ කාර්යය ආරම්භයේ දී වාර්ෂික ආදායම් බලපත්‍රය ලබා ගැනීම සඳහා මුල් ලියාපදිංචියේ සිට වසර තුනක් (03) දක්වා මෙරට ලියාපදිංචි කරන ලද අළුත්ම වාහන (Brand New Vehicles) සඳහා වායු විමෝචන පරීක්ෂණ කාර්යයට ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවිය. මෙය 2011.02.01 දින සිට පළමු වසර දක්වා සීමාවිය. 1975 දෙසැම්බර් මස 31 දිනට පෙර මෙරට ලියාපදිංචි කර ලද වාහන සඳහා වාර්ෂික ආදායම් බලපත්‍රය ලබා ගැනීමේ දී වායු විමෝචන පරීක්ෂණ සහතිකය ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. ඊට අමතරව සියළුම කෘෂිකාර්මික වාහන සඳහා වාර්ෂික ආදායම් බලපත්‍රය ලබා ගැනීමේ දී ද වායු විමෝචන පරීක්ෂණ සහතිකය ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. වායු විමෝචන පරීක්ෂණ කාර්යයන් නියාමනය කිරීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල භූමිය තුල වායු විමෝචන ව්‍යාපෘති කාර්යාලයක් පවත්වාගෙන යන අතර එහි කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

| | |
|---|---|
| අධ්‍යක්ෂ | : වායු විමෝචන වැඩසටහන |
| ගණකාධිකාරී | : වායු විමෝචන වැඩසටහන |
| මෝටර් රථ පරීක්ෂක | : 01 |
| දෙපාර්තමේන්තු ලිපිකරු | : 01 |

<u>අංශයේ කාර්යභාරය</u>

මෙම අංශය තුලින් සිදු කරනු ලබන කාර්යයන් ලෙස වායු විමෝචන වැඩසටහන පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම, අදාළ චක්‍රලේඛ නිකුත් කිරීම හා අදාළ කටයුතු සිදු කිරීම, රථ

වාහන කළමනාකරණය හා මාර්ග ආරක්‍ෂාව පිළිබඳ කටයුතු සිදු කිරීම, මෙම වායු විමෝචන ව්‍යාපෘති කාර්යාලය මගින් සිදු කරනු ලබයි.

වායු විමෝචන කටයුතුවල දැනට ඇති ගැටළුව වන්නේ අදාළ සමාගම්වල ඇතැම් මධ්‍යස්ථාන මඟින් වංචනික ලෙස දුම් පිට කරන වාහන සඳහා බලපත්‍ර ලබා දෙන බවයි.වායු විමෝචන කටයුතු වඩා හොඳින් අධීක්ෂණය කිරීම සඳහා දෙපාර්තමේන්තුව මඟින් මාර්ගස්ථ පරීක්ෂා කිරීම් පුළුල් කිරීමට කටයුතු යොදා ඇත.මේ යටතේ මහා මාර්ගයේදී දුම් පරීක්ෂාව සිදු කළ හැකි යන්ත්‍ර ප්‍රමාණය වැඩි කිරීමට කටයුතු යොදා ඇති අතර, මහජනතාවගෙන් ලැබෙන තොරතුරු මත පදනම්ව සිදුකරනු ලබන පරීක්ෂාවන් පුළුල් කර ඇත.මෙහිදී දුම් සහතිකය සහිත, වාහනයක් වුවත් මහාමාර්ග වලදී දුම් පිට කරමින් ධාවනය වන අවස්ථා වලදී ඒවා නවතා පරීක්ෂා කිරීමටත්, එවැනි වාහන සම්බන්ධව දුරකථන පණිවුඩ ලැබුනු විටදී ඒවා ගෙන්වා පරීක්ෂා කිරීමටත්, විධිවිධාන සලසා ඇත. මේ තුළින් මහජනතාව අපේක්ෂා කරන සේවය දුම් පරීක්ෂණයක් තුලින් ලබාදීමට හැකි වෙතැයි දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි.

## 5. 2011 දී ආදායම් හා වියදම්

### 5.1 ගිණුම් ශාඛාව

| | | |
|---|---|---|
| ප්‍රධාන ගණකාධිකාරී | : | ඩී.එස්.ආර්.කේ.ගුණතිලක මහත්මිය |
| ගණකාධිකාරී | : | ඩී.කේ.එම්.ආර්. කුමාරසිරි මහතා |
| අධීක්‍ෂණ නිළධාරී | : | එල්.ජී.එස්. මංගලිකා මිය |

| <u>කාර්ය මණ්ඩලය</u> | | <u>සංඛ්‍යාව</u> |
|---|---|---|
| විමර්ශන සහ සංවර්ධන සහකාර | : | 01 |
| විමර්ශන සහකාර | : | 02 |
| ගිණුම් සහකාර | : | 01 |
| දෙපාර්තමේන්තු ලිපිකරු | : | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | : | 14 |
| කාර්යාල කාර්ය සහයක | : | 03 |
| කාර්යාල කම්කරු | : | 02 |
| රියදුරු | : | 01 |

අංශයේ කාර්යභාරය

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සියළුම නිළධාරීන් සඳහා වැටුප් ගෙවීම, අතිකාල ගමන් වියදම් හා ණය අත්තිකාරම් ගෙවීම් කටයුතු කිරීම දෙපාර්තමේන්තුවට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම, සියළුම උපකරණ හා ගොඩනැගිලි අළුත්වැඩියා කටයුතු, ආදායම් වියදම් පිළිබඳ සියළු ගිණුම් කටයුතු, විගණන විමසුම් හා රාජ්‍ය ගිණුම් කාරක සභාවට අදාළ කටයුතු සඳහා වාර්තා සැපයීම, ආදායම් රැස්කර ගිණුම් ගත කිරීම හා මහභාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම, මුදල් රෙගුලාසි 135 යටතේ බල තල පැවරීමට අදාල කටයුතු ආදිය ගිණුම් ශාඛාවේ කාර්යභාරය වේ.

## 5.2 සුඛෝපභෝගී බදු ශාඛාව

| | |
|---|---|
| ගණකාධිකාරී | : අයි.ජී.එස්.එස්. සිරිමාන්න මිය |
| අධීක්ෂණ නිළධාරී | : බී.ජී.ඒ.ඩී. පෝල් මහතා |

| කාර්ය මණ්ඩලය | | සංඛ්‍යාව |
|---|---|---|
| විමර්ශන සහකාර | : | 01 |
| දෙපාර්තමේන්තු ලිපිකරු | : | 03 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | : | 02 |
| කාර්යාල කාර්ය සහයක | : | 01 |

අංශයේ කාර්යභාරය

1995 අංක 16 දරණ මුදල් පනත හා සංශෝධිත පනත් යටතේ සුඛෝපභෝගී, අර්ධ සුඛෝපභෝගී, අර්ධ සුඛොපභෝගී ද්විත්ව කාර්යය බදු අයකිරීම සිදුකරන රක්ෂණ ආයතන කළමනාකරණය කිරීම හා මහ පෙන්වීම, බදු ගෙවීම පිළිබඳ වාහන හිමියන් දැනුවත් කිරීම සහ හිග බදු අයකිරීම, බදු ගෙවීම සම්බන්ධව ඒ ඒ වාහන වෙනුවෙන් පරිගණක පද්ධතිය පවත්වාගෙන යාම, බදු ආදායම් මහභාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම හා ආදායම් වාර්තා සකස් කිරීම.

## 5.3 අභ්‍යන්තර විගණන හා විමර්ශන ශාඛාව

ගණකාධිකාරී : ආර්. කහඳුවආරච්චි මහතා

| <u>කාර්ය මණ්ඩලය</u> | | <u>සංඛ්‍යාව</u> |
|---|---|---|
| රාජ්‍ය කළමනාකරණ සහකාර | : | 03 |
| කාර්යාල කාර්ය සහයක | : | 02 |

<u>අංශයේ කාර්යභාරය</u>

දෙපාර්තමේන්තුවට අයත් ප්‍රධාන කාර්යාලය, උප කාර්යාලය ඇතුළු සියළුම ශාඛා කාර්යාල වල අභ්‍යන්තර විගණන කටයුතු සහ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් පවරන ලද රාජකාරී කටයුතු ඉටු කිරීම අංශයේ කාර්යභාරය වේ.

## <u>5.4 ආදායම් ගිණුම</u>

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් රැස් කරනු ලබන සියළුම ආදායම් කාණ්ඩ තුනක් යටත් දැක්විය හැක. එනම්,

- ✓ සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද
- ✓ මෝටර් වාහන විකිණීම මත බදු
- ✓ මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අයකරනු ලබන ගාස්තු

**2011 වසර සඳහා ඇස්තමේන්තු කල ආදායම හා තත්‍ය ආදායම.**

**5.4.1 වගුව**

| **ආදායම් විස්තරය/ ආදායම් ශීර්ෂය** | **2011 ඇස්තමේන්තුගත ආදායම** | **2011තත්‍ය ආදායම** |
|---|---|---|
| සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද | 575,000,000.00 | 714,050,018.00 |
| මෝටර් වාහන විකිණීම මත බදු | 32,000,000.00 | 42,289,200.00 |
| මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අයකරනු ලබන ගාස්තු | 5,800,000,000.00 | 6,325,878,728.00 |
| **මුළු ආදායම** | **6,407,000,000.00** | **7,082,217,946.00** |

**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු**

2011 වසරේ දී සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද තත්‍ය ආදායම හා සැසදීමේ දී 124%කින් ඉහළ ගොස් ඇති අතර මෝටර් වාහන විකිණීම මත බදු 132% කින් ඉහළ ගොස් ඇත. ඊට අමතරව මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අයකරනු ලබන ගාස්තු තත්‍ය ආදායමට වඩා 9%කින් ද ඉහළ ගොස් ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස මුළු තත්‍ය ආදායම 2011 ඇස්තමේන්තු ගත ආදායමට වඩා 110%කින් ඉහළ ගොස් ඇත. වසර 2010 දී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ තත්‍ය ආදායමට සාපේක්ෂව 2011 මුළු තත්‍ය ආදායමේ වැඩිවීම 181%කි.

## 5.5 වියදම් ගිණුම

**5.5.1 වගුව**

| **වියදම්විස්තරය/වියදම් ශීර්ෂය** | **2011 ඇස්තමේන්තුගත වියදම** | **2011 තත්‍ය වියදම** |
|---|---|---|
| පුනරාවර්ථන වියදම | 752,450,000.00 | 1,788,592,500.00 |
| ප්‍රාග්ධන වියදම | 822,500,000.00 | 1,054,991,905.00 |
| මුළු වියදම | **1,574,950,000.00** | **2,843,584,405.00** |

**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

2011 වසරේ දෙපාර්තමේන්තුවේ මුළු ඇස්තමේන්තු වියදම රු. 1,574,950,000.00වන අතර වසරේ තත්‍ය වියදම රු. 2,843,584,405කි. එම වියදම පුනරාවර්ථන වියදම හා ප්‍රාග්ධන වියදම ලෙස ප්‍රධාන වියදම් ශීර්ෂ දෙකක් යටතේ කාණ්ඩ ගත කළ හැකි අතර වසරේ තත්‍ය පුනරාවර්ථන වියදම රු. 1,788,592,500.00ක් වන අතර තත්‍ය ප්‍රාග්ධන වියදම රු. 1,054,991,905.00 කි.

## 5.5.1මූල්‍ය ප්‍රගතිය (ප්‍රාග්ධන වියදම්)

### 5.5.2 වගුව :-ප්‍රාග්ධන වියදම් වාර්තාව - 2011 (ජනවාරි - දෙසැම්බර්)

| වැය ශීර්ෂය | විස්තරය | වටිනාකම(රු.ශත) | මූල්‍ය ප්‍රගතිය% |
|---|---|---|---|
| **මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරිම** | | | |
| 307-02-01-2001 | ගොඩනැගිලි සහ ඉදිකිරිම් | 859,110.24 | 85% |
| 307-02-01-2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 809,397.53 | 53% |
| 307-02-01-2003 | වාහන | 197,645.19 | 9.8% |
| **මූලධන වත්කම් අත්පත් කරගැනිම** | | | |
| 307-02-01-2102 | ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ | 4,376,283.21 | 87.5% |
| 307-02-01-2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 8,253,468.26 | 82.5% |
| හැකියා වර්ධන | | | |
| 307-02-01-2401 | පුහුණුවීම් සහ හැකියා වර්ධනය | 292,250.00 | 9.7% |
| **ගොඩනැගිලි සහ ඉදිකිරිම්** | | | |
| 307-02-01-09- | වේරහැර යෝජිත ගොඩනැගිල්ල අත්පත් කර ගැනිම | 20,688,227.70 | 98% |
| 307-02-01-10- | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රාදේශීය කාර්යාල ඇති කිරිම් | 37,447,640.67 | 85% |
| **වෙනත් මූලධන වියදම්** | | | |
| 307-02-01-01-2502 | රියදුරු බලපත්‍ර මුද්‍රණය | 982,067,882.22 | 99% |

**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

**5.6 ඉදිකිරීම් සම්බන්ධ ප්‍රාග්ධන වැය ව්‍යපෘති.**

- වේරහැර උප කාර්යාලයේ ලේඛණාගාරය රු.මි.563.4ක වියදමින් ඉදිකිරීමේ සැලසුම් ආරම්භ කිරීම.
- රු. මි. 18.8ක වියදමින් ප්‍රධාන කාර්යාලය ආපන ශාලාව නවීකරණය කිරීම සඳහා කටයුතු ආරම්භ කිරීම.
- රු.මි.11.61ක වියදමකින් ගාල්ල දිස්ත්‍රික් කාර්යාලයේ (ඊ කෝට්ස්) ගොඩනැගිල්ලේ කොටසක් නවීකරණය කිරීම.
- පුත්තලම දිස්ත්‍රික් කාර්යාල ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු රු.මි 9.19ක වියදමින් අභ්‍යන්තර පිරිසැකසුම් කටයුතු ආරම්භ කොට ඇත.
- රු.මි. 53.34ක වියදමින් නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාල ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීම.
- රු.මි. 35.22ක වියදමින් හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලයේ වැඩකටයුතු අවසන් කිරීම.
- රු.මි.7.34ක වියදමින් වව්නියාව දිස්ත්‍රික් කාර්යාල ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර අභ්‍යන්තර පිරිසැකසුම් කටයුතු සිදු කිරීම.
- මඩකලපුව දිස්ත්‍රික් කාර්යාල ගොඩනැගිල්ල රු.මි.8.20ක වියදමින් ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර අභ්‍යන්තර පිරිසැකසුම් කටයුතු සඳහා යොමු කර ඇත.
- කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලයේ අභ්‍යන්තර පිරිසැකසුම් කටයුතු රු.මි. 10.65ක වියදමින් අවසන් කිරීම.
- ගම්පහ දිස්ත්‍රික් කාර්යාලයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර රු.මි.10.90ක වියදමින් අභ්‍යන්තර පිරිසැකසුම් කටයුතු නිම කිරීම.

ඇමුණුම් 01

## වාහන අළුතින් ලියාපදිංචි කිරීමේ ගාස්තු - 2011

| වාහන පන්තිය | ලියාපදිංචි ගාස්තුව | අංක තහඩු ගාස්තු | බර සහතින ගාස්තු | තැපැල් ගාස්තු | පැවරුම් ගාස්තු | දඩ රේගුවෙන් නිදහස් කල දින සිට | |
|---|---|---|---|---|---|---|---|
| මෝටර් කාර් | CC =1600,<br>15,000/-<br>CC>1600,<br>20,000 | 3,300/- | 500/- | 50/- | 7,750/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 6,000/-<br>7,500/-<br>10,000/-<br>15,000/-<br>25,000/- |
| ද්විත්ව කාර්යය වාහන | 15,000/- | 3,300/- | 500/- | 50/- | 7,750/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 6,000/-<br>7,500/-<br>10,000/-<br>15,000/-<br>25,000/- |
| මෝටර් ලොරි | 3,000/- | 3,300/- | 500/- | 50/- | 3,750/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 4,000/-<br>5,000/-<br>6,800/-<br>7,800/-<br>9,800/- |
| මෝටර් බස් | 3,000/- | 3,300/- | | 50/- | 3,750/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 7,000/-<br>8,400/-<br>9,500/-<br>10,500/-<br>13,500/- |
| විශේෂ කාර්යය වාහන | 20,000/- | 3,300/- | 500/- | 50/- | 2,800/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 3,000/-<br>5,000/-<br>7,000/-<br>9,000/-<br>10,000/- |
| ගිලන් රථ | 10,000/- | 3,300/- | 500/- | 50/- | 1,800/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 2,000/-<br>2,500/-<br>3,000/-<br>4,000/-<br>4,500/- |
| අවමංගල රථ | 10,000/- | 3,300/- | 500/- | 50/- | 1,800/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 6,000/-<br>7,000/-<br>8,000/-<br>9,000/-<br>10,000/- |
| ලොරි ට්‍රේලර් | 7500/- | 3,300/- | 500/- | 50/- | 3,100/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 5,000/-<br>6,000/-<br>7,000/-<br>8,000/-<br>9,000/- |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ඉඩම් වාහන/<br>ට්‍රැක්ටර් රෝද<br>4 | 7,000/- | 3,300/- | 500/- | 50/- | 2,060/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 2,750/-<br>4,500/-<br>6,000/-<br>7,000/-<br>800/- |
| අත් ට්‍රැක්ටර්<br>රෝද 4 | 1,500/- | 2,400/- | 500/- | 50/- | 1,150/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 1,750/-<br>2,000/-<br>2,500/-<br>3,500/-<br>5,000/- |
| ට්‍රැක්ටර්<br>ට්‍රේලර/<br>බව්සරය | 6,000/- | 3,300/- | 500/- | 50/- | 2,800/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 2,000/-<br>3,000/-<br>4,000/-<br>5,000/-<br>6,000/- |
| ප්‍රයිම්මුවර් | 15,000/- | 3,300/- | 500/- | 50/- | 3,750/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 4,000/-<br>5,000/-<br>7,000/-<br>9,000/-<br>10,000/- |
| මෝටර්<br>ට්‍රයිසිකල් | 2,500/- | 2,800/- | | | 1,200/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 2,500/-<br>3,000/-<br>4,000/-<br>5,000/-<br>6,000/- |
| මෝටර්<br>සයිකල් | 2,000/- | 2,400/- | | | 500/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 1,500/-<br>1,750/-<br>2,000/-<br>2,500/-<br>4,000/- |
| මෝටර්<br>ට්‍රයිසිකල්/<br>වෑන් | 3,000/- | 2,800/- | | | | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 3,000/-<br>4,000/-<br>5,000/-<br>7,000/-<br>9,000/- |
| විකල්ප<br>ඉන්ධන<br>මෝටර් වාහන | 1,500/- | | | 50/- | 1,540/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 2,000/-<br>2,500/-<br>3,000/-<br>3,500/-<br>4,000/- |
| විදුලිබලයෙන්<br>ධාවනය වන<br>වාහන | 1,500/- | | | 50/- | 1,540/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 2,000/-<br>2,500/-<br>3,000/-<br>3,500/-<br>4,000/- |
| ආබාධිතයන්<br>ගේ වාහන | 1,000/- | | | 50/- | 1,150/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 2,000/-<br>2,500/-<br>3,000/-<br>4,000/-<br>5,000/- |

ඇමුණුම් 02

## වාහන පැවරීමේ ගාස්තු - 2011 (එක්දින සේවා)

(රුපියල්)

| වාහන පන්තිය | පැවරීමේ ගාස්තුව | පරම අයිතිය | | | උගසක් | | සංශෝධන ගාස්තු |
|---|---|---|---|---|---|---|---|
| | | ලියාපදිංචි කිරීම | දීර්ඝ කිරීම | අවලංගු කිරීම | ලියාපදිංචි කිරීම | අවලංගු කිරීම | |
| මෝටර් කාර් | 3750/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| ද්විත්ව කාර්යය වාහන | 3750/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| ඉඩම් වාහන (කෘෂිකාර්මික) | 1150/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| ඉඩම් වාහන (කෘෂිකාර්මික | 1800/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| ඉඩම් වාහන (ට්‍රැක්ටර් රෝද | 2060/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| අත් ට්‍රැක්ටර්ට | 1150/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| මෝටර් සයිකල් | 1150/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| මෝටර් ට්‍රයිසිකල් | 1150/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| මෝටර් ට්‍රයිසිකල්/ වෑන් | 1150/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| මෝටර් ලොරි | 3750/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| මෝටර් ලොරි/ පෝක් ලිෆ්ට් | 3750/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| මෝටර් ලොරි/ ප්‍රයිම්මූවර් | 3750/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| මෝටර් කෝච් | 3750/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| ආබාධිතයන්ගේ වාහන | 1150/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| මෝටර් ගිලන්රථ | 1800/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| අවමංගල රථ | 1800/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| ලොරි ට්‍රේලර් | 3100/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| ට්‍රැක්ටර් ට්‍රේලර්/ බව්සර් | 1800/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| විකල්ප ඉන්ධන මෝටර් වාහන | 1540/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| විදුලිබලයෙන් ධාවනය වන | 1540/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| විශේෂ කාර්යය වාහන | 1800/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |

මූලාශ්‍ර - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

* **ලිපිද්‍රව්‍ය හා තැපැල් ගාස්තු සඳහා රු. 50ක් අයකරනු ලැබේ.**

ඇමුණුම් 03

## වාහන පැවරීමේ ගාස්තු - 2011 (සාමාන්‍ය සේවා)

(රුපියල්)

| වාහන පන්තිය | පැවරීමේ ගාස්තුව | පරම අයිතිය | | | උගසක් | | සංශෝධන ගාස්තු |
|---|---|---|---|---|---|---|---|
| | | ලියාපදිංචි කිරීම | දීර්ඝ කිරීම | අවලංගු කිරීම | ලියාපදිංචි කිරීම | අවලංගු කිරීම | |
| මෝටර් කාර් | 2500/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| ද්විත්ව කාර්යය වාහන | 2500/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| ඉඩම් වාහන (කෘෂිකාර්මික) | 500/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| ඉඩම් වාහන (කෘෂිකාර්මික | 1000/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| ඉඩම් වාහන (ට්‍රැක්ටර් රෝද | 1200/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| අත් ට්‍රැක්ටර් | 500/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| මෝටර් සයිකල් | 500/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| මෝටර් ත්‍රයිසිකල් | 500/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| මෝටර් ත්‍රයිසිකල්/ වෑන් | 500/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| මෝටර් ලොරි | 2500/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| මෝටර් ලොරි/ ෆෝක් ලිෆ්ට් | 2500/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| මෝටර් ලොරි/ ප්‍රයිම්මූවර් | 2500/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| මෝටර් කෝච් | 2500/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| ආබාධිතයන්ගේ වාහන | 500/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| මෝටර් ගිලන්රථ | 1000/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| අවමංගල රථ | 1000/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| ලොරි ට්‍රේලර් | 2000/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| ට්‍රැක්ටර් ට්‍රේලර්/ බව්සර් | 1000/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| විකල්ප ඉන්ධන මෝටර් වාහන | 800/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| විදුලිබලයෙන් ධාවනය වන | 800/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| විශේෂ කාර්යය වාහන | 1000/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |

මූලාශ්‍ර - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

* **ලිපිද්‍රව්‍ය හා තැපැල් ගාස්තු සඳහා රු. 50ක් අයකරනු ලැබේ.**

ඇමුණුම් 04

## නව රියදුරු බලපත්‍රයට අදාළ අයිභාරයන්

## (2011 )

(රුපියල්)

| සේවාව | අයභාරය (රුපියල්) | |
|---|---|---|
| | සාමාන්‍ය සේවා | එක්දින සේවා |
| 1. නව රියදුරු බලපත්‍ර | | |
| එක් වාහන පන්තියක් සඳහා | 1700.00 | |
| වාහන පන්ති දෙකක් සඳහා | 2000.00 | |
| වාහන පන්ති තුනක් සඳහා | 2250.00 | |
| 2. අළුත් කිරීම හෝ වලංගු කාලය දීර්ඝ කිරීම නියමිත දිනට | 1700.00 | 2200.00 |
| ප්‍රමාද වන සෑම වසරක් හෝ කොටසක් සඳහා අමතර | 250.00 | |
| 3. රියදුරු බලපත්‍රයේ අනු පිටපතක් නිකුත් කිරීම | 1700.00 | 2200.00 |
| 4. රියදුරු බලපත්‍රයේ තොරතුරු සංශෝධනය | 2000.00 | 2500.00 |
| 5. රියදුරු බලපත්‍රය පරිවර්තනය | | |
| වර්තමාන රියදුරු බලපත්‍රය නව බලපත්‍රය බවට | 1700.00 | 2200.00 |
| විදේශ රියදුරු බලපත්‍රය නව රියදුරු බලපත්‍රය, -ලාංකික පුරවැසියන් සඳහා | 2000.00 | 2500.00 |
| -විදේශීය පුරවැසියන් සඳහා පමණි | 10000.00 | 10500.00 |
| 6. විදේශීය පුරවැසියන් සඳහා නව රියදුරු බලපත්‍රය | 15000.00 | |
| 7. රියදුරු බලපත්‍ර උධෘතයක් | 500.00 | |
| 8. විදේශීය පුරවැසියන් සඳහා රිය පැදවීමේ අවසරපත (එක් මාසයකට) | 1000.00 | |
| 9. අන්තර් ජාතික නව රියදුරු බලපත්‍රය | 2000.00 | 2500.00 |
| 10. ලිඛිත පරීක්ෂණය නැවත අයදුම් කිරීම | 250.00 | |
| 11. ප්‍රායෝගික පරීක්ෂණය නැවත අයදුම් කිරීම | 500.00 | |